# විද්‍යාව

# විෂය නිර්දේශය

# 8 ශ්‍රේණිය

8 ශ්‍රේණියේ සිසුන් සඳහා 7ශ්‍රේණියේ විෂය නිර්දේශයෙන් ආවරණය කිරීමට නියමිත විෂය අන්තර්ගතය සහ 8 ශ්‍රේණියේ විෂය නිර්දේශයෙන් ආවරණය කිරීමට නියමිත විෂය අන්තර්ගතය මෙහි ඇතුලත් වේ.

නිපුණතාව 1 - ජෛව පද්ධතිවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ජීවය හා ජෛව ක්‍රියියාවලි අන්වේෂණය කරයි.

නිපුණතාව 2 - ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණුණින් යුතුතු ව පදාර්ථය, පදාර්ථයේ ගුණ හා ඒවායේ අන්තර්ක්‍රියා ගවේෂණය කරයි.

නිපුණතාව 3 - කාර්යක්ෂමතාව හා ඵලදායිතිතාව ප්‍රශස්ත මට්ටමෙන් පවත්වා ගනිමින් විවිධ ශක්ති, පදාර්ථ සමඟ දක්වන අන්තර්ක්‍රියා සහ ශක්ති පරිවර්තන භාවිත කරයි.

නිපුණතාව 4 - ස්වාභාවික සංසිද්ධි පිළිබඳ මනා අවබෝධයෙන් යුතු ව, ස්වභාවික සම්පත් බුද්ධිමත් ලෙස හා තිරසර ලෙස භාවිත කිරීම සඳහා පෘථිවියේ හා අවකාශයේ ස්වභාවය, ගුණ හා කාර්යාවලි අනාවරණය කරයි.

# 7 ශ්‍රේණියෙන් තෝරා ගන්නා ලද ආවරණය කිරීමට නියමිත විෂය අන්තර්ගතය සහ ඉගෙනුම් ඵල

| නිපුණතා මට්ටම | සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන | විශේෂ සටහන් |
|---|---|---|---|---|
| 3.5 සරල ක්‍රියාකාරකම් ආශ්‍රිත ව ශක්ති ආකාරවල භාවිත ආදර්ශනය කරයි. | • ශක්ති ආකාර<br>• යාන්ත්‍රික<br>• විද්‍යුත්<br>• ශබ්ද<br>• ආලෝක<br>• තාපජ<br>• රසායනික | 1. විවිධ ශක්ති ආකාර සඳහා උදාහරණ සපයයි<br>2. විවිධ ශක්ති ආකාර භාවිත කරන උපකරණ ලේඛනගත කරයි.<br>3. විවිධ ශක්ති ආකාරවල භාවිත ආදර්ශනය සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කරයි.<br>4. විවිධ ශක්ති ආකාරවල භාවිත අගය කරයි. | 03 | • 1,2 ඉගෙනුම් ඵල නිවස පාදක පැවරුම් මගින් ලඟා කරගැනීමට කටයුතු සලසන්න.<br>• ක්‍රියාකාරකම් ගුරු ආදර්ශනයක් ලෙස සිදු කරන්න. |
| 4.1 පෘථිවියේ ව්‍යුහය ආදර්ශනය කිරීම සඳහා ආකෘති නිපදවා භාවිත කරයි | • පෘථිවි ග්‍රහයා<br>• පෘථිවියේ ව්‍යුහය<br>• භූ තැටි සහ භූ තැටි චලනය | 1. පෘථිවියේ හරය ප්‍රාවරණය හා කබොල විස්තර කරයි.<br>2. භූ තැටි චලනය වන බව ප්‍රකාශ කරයි<br>3. පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය ආදර්ශනය කිරීම සඳහා සරල ක්‍රියාකාරකම් කරයි.<br>4. පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය ආදර්ශනය කිරීම සඳහා ආකෘති සාදයි.<br>5. භූ තැටි චලනය ආදර්ශනය කිරීම සඳහා සරල ක්‍රියාකාරකම් කරයි.<br>6. පෘථිවි කබොලේ ගතික බව පිළිගනියි. | 03 | • ආකෘති,කෙටි වීඩියෝ පට සහ ගුරු ආදර්ශන යොදා ගනිමින් සාකච්ඡා මෙහෙයවා ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |
| 3.6 ඡායා ඇතිකිරීම පිළිබඳ සංසිද්ධි අධ්‍යයනය කරයි. | • ආලෝකය<br>• ඡායා | 1. ආලෝකයේ ලක්ෂ්‍යාකාර හා විස්තෘත ප්‍රභව අතර ඇති වෙනස්කම් දක්වයි<br>2. ඡායා ඇති වීම සඳහා බලපාන සාධක විස්තර කරයි. | 04 | • ගුරු ආදර්ශන යොදා ගනිමින් සාකච්ඡා මෙහෙයවා |

| | | | | |
|---|---|---|---|---|
| 3.7 දර්පණ මගින් ඇතිකරන ප්‍රතිබිම්බවල ස්වභාවය අන්වේෂණය කිරීම සඳහා සරල ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • ප්‍රතිබිම්බ<br>  • තල දර්පණ<br>  • වක්‍ර දර්පණ | 3. තල දර්පණ හා වක්‍ර දර්පණ මගින් ඇති කරන ප්‍රතිබිම්බවල ස්වභාවය විස්තර කරයි.<br>4. විවිධ දර්පණ වර්ගවල භාවිත දක්වයි.<br>5. අභිසාරී අපසාරී හා සමාන්තර ආලෝක කදම්බ භාවිත කරමින් ඡායාවල ස්වභාවය ආදර්ශනය කිරීම සඳහා ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>6. තල දර්පණ හා වක්‍ර දර්පණ මගින් ඇති කරන ප්‍රතිබිම්බවල ස්වභාවය නිරීක්ෂණය කිරීම සඳහා ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>7. ඡායා ඇති වීම සහ ප්‍රතිබිම්බ ඇති වීම එකිනෙකට වෙනස් සංසිද්ධි බව පිළිගනියි. | | ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |
| 1.6 අණ්වීක්ෂය නිවැරදි ව භාවිත කරයි. | • ජීව විද්‍යාවේ භාවිත වන සමහර වැදගත් උපකරණ<br>  • සරල අණ්වීක්ෂය<br>  • සංයුක්ත අණ්වීක්ෂය<br>  • අණ්වීක්ෂයේ විභේදන බලය හා විශාලනය | 1. සරල අණ්වීක්ෂයේ හා සංයුක්ත අණ්වීක්ෂයේ ප්‍රධාන කොටස් හඳුනා ගනියි.<br>2. සංයුක්ත අණ්වීක්ෂයේ විවිධ කොටස්වල කෘත්‍යය විස්තර කරයි.<br>3. විභේදන බලය හා විශාලනය යන වචනවල අර්ථය පැහැදිලි කරයි.<br>4. සංයුක්ත අණ්වීක්ෂය නිවැරදි ව භාවිත කරයි.<br>5. අන්වීක්ෂය භාවිතයෙන් ශාක හා සත්ත්ව සෛල නිවැරදි ව නිරීක්ෂණය කරයි.<br>6. අන්වීක්ෂය පරෙස්සමෙන් පරිහරණය කළ යුතු බව පිළිගනියි. | 02 | • සරල හා සංයුක්ත අන්වීක්ෂ භාවිතයෙන් සත්ත්ව හෝ ශාක සෛල වර්ගයක් (එක් වර්ගයක් පමණක්) නිරීක්ෂණයට සෑම සිසුවෙකුටම අවස්ථාව දෙන්න.<br>• රූප සටහන්, කෙටි වීඩියෝ පට සහ ගුරු ආදර්ශන යොදා ගනිමින් සාකච්ඡා මෙහෙයවා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |
| 3.8 ධ්වනිය ජනනයට හා සම්ප්‍රේෂණයට අදාළ සරල ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • ධ්වනිය<br>• ධ්වනි ජනනය (කම්පනය)<br>• ධ්වනි සම්ප්‍රේෂණය<br>• වේගය<br>• මාධ්‍ය | 1. ධ්වනිය ජනනය වන්නේ කම්පනවලින් බව පැහැදිලි කරයි.<br>2. ධ්වනි සම්ප්‍රේෂණය සඳහා මාධ්‍යයක අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>3. විවිධ මාධ්‍යවල ශබ්දයේ වේගය වෙනස් බව පැහැදිලි කරයි.<br>4. සුදුසු වස්තූන් කම්පනය කරමින් ධ්වනිය උත්පාදනය කරයි.<br>5. විවිධ මාධ්‍යවල ධ්වනි සම්ප්‍රේෂණය විවිධ බව ආදර්ශනය කිරීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම්කර ක්‍රියාත්මක කරයි.<br>6. ධ්වනිය ජනනය වන්නේ කම්පනවලින් බව පිළිගනියි.<br>7. ධ්වනි සම්ප්‍රේෂණය සඳහා මාධ්‍යය බලපාන බව පිළිගනියි. | 02 | • ගුරු ආදර්ශන යොදා ගනිමින් සාකච්ඡා මෙහෙයවා ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |
| 1.7 ජීවයේ සංවිධාන මට්ටම් අන්වේෂණය කරයි.<br>1.8 මානව ආහාර ජීරණ පද්ධතිය සහ ශ්වසන පද්ධතිය ආශ්‍රිත ව්‍යුහ කෘත්‍ය සම්බන්ධතා අනාවරණය කරයි. | • ජීවයේ සංවිධාන මට්ටම්<br>• සෛලය<br>• පටකය<br>• අවයවය<br>• පද්ධතිය<br>• ජීවියා<br>• ආහාර ජීරණ පද්ධතිය | 1. ජීවියා දක්වා වූ සංවිධාන මට්ටම්වල අනුක්‍රමාධිපත්‍යය දක්වයි.<br>2. විවිධ සංවිධාන මට්ටම් හඳුනා ගැනීම සඳහා ජීවීන් නිරීක්ෂණය කරයි.<br>3. රූපසටහන් උපයෝගි කර ගනිමින් මානව ආහාර ජීරණ පද්ධතියේ ව්‍යුහය විස්තර කරයි.<br>4. රූපසටහන් උපයෝගිකර ගනිමින් මානව ශ්වසන පද්ධතියේ ව්‍යුහය විස්තර කරයි.<br>5. මානව ආහාර ජීරණ පද්ධතිය සහ ශ්වසන පද්ධතිය ආදර්ශනය කිරීම සඳහා ආකෘති නිපදවයි. | 02 | • 5 වන ඉගෙනුම් ඵල නිවස පාදක පැවරුම් මගින් ලඟා කරගැනීමට කටයුතු සලසන්න.<br>• ආකෘති,කෙටි වීඩියෝ පට සහ ගුරු ආදර්ශන යොදා ගනිමින් සාකච්ඡා මෙහෙයවා |

| | | | | |
|---|---|---|---|---|
| | • ශ්වසන පද්ධතිය | 6. ජෛව ලෝකයේ සංවිධානයේ සංකීර්ණත්වය අගය කරයි. | | ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |
| 4.2 වායුගෝලය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | • වායුගෝලය<br>• වායුගෝලයේ ස්තර<br>• වාතය සහ එහි සංඝටක | 1. වායුගෝලයේ ස්තර හරහා පීඩනය හා උෂ්ණත්වය වෙනස්වන ආකාරය ගුණාත්මක ව විස්තර කරයි.<br>2. පරිවර්තිගෝලයේ වාතයේ සංඝටක දක්වයි.<br>3. වායුගෝලයේ ස්තර හා ඒවායෙහි ලාක්ෂණික රූපසටහන් මගින් නිරූපණය කරයි.<br>4. පෘථිවිය මත ජීවයේ පැවැත්ම සඳහා වායුගෝලයේ වැදගත්කම වටහා ගනියි. | 02 | • ආකෘති,කෙටි වීඩියෝ පට, රූප සටහන් සහ ගුරු ආදර්ශන යොදා ගනිමින් සාකච්ඡා මෙහෙයවා ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |
| 3.9 උෂ්ණත්වමාන නිවැරදි ව පරිහරණය කරයි. | • තාපය සහ උෂ්ණත්වය<br>• උෂ්ණත්වය මැනීම<br>• උෂ්ණත්වමාන සහ උෂ්ණත්වයේ ඒකක | 1. භාවිත කරන ද්‍රව්‍ය හා යොදාගන්නා පරිමාණය අනුව උෂ්නත්වමාන වර්ග දෙකක් ඇතිබව පිළිගනියි.<br>2. උෂ්ණත්වයේ ඒකක සෙල්සියස් අංශක, ෆැරන්හයිට් අංශක සහ කෙල්වින් බව ප්‍රකාශ කරයි.<br>3. තාපාංකය හා ද්‍රවාංකය යන පද පැහැදිලි කරයි.<br>4. මානව ශරීර උෂ්ණත්වය නියත අගයක් ගන්නා බවත් උණ තත්වය නිශ්චය කර ගැනීම සඳහා වෛද්‍ය උෂ්ණත්වමානය භාවිත කරන බවත් ප්‍රකාශ කරයි. | 02 | |

| | | | | |
|---|---|---|---|---|
| 4.3 පසේ විවිධ ආකාර හා එහි සංයුතිය අනාවරණය කරගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදු කරයි. | • පස<br>• පස් ආකාර<br>• පසේ සංයුතිය<br>• පාංශු වාතය, පාංශ ජලය, පාංශ ජීවීන් සහ කාබනික ද්‍රව්‍ය<br>• පාංශු ඛාදනය | 1. පසේ විවිධ ආකාර නම් කරයි.<br>2. පසේ විවිධ ආකාර සංසන්දනය කරයි.<br>3. පසේ සංයුතිය දක්වයි.<br>4. පසේ සංඝටක සහ ඒවායේ ක්‍රියාකාරිත්වය විස්තර කරයි.<br>5. පාංශු පැතිකඩක ආකෘතියක් නිපදවයි.<br>6. පසේ වාතය, ජලය, ජීවීන් සහ කාබනික ද්‍රව්‍ය ඇති බව ආදර්ශනය කිරීම සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කරයි.<br>7. පසේ විවිධ ආකාරවල සංඝටක නිරීක්ෂණය කිරීම සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කරයි.<br>8. පාංශු ඛාදනය ආදර්ශනය කිරීම සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කරයි.<br>9. පසේ සංඝටක සහ පාංශු ඛාදනයට අදාළ වාර්තා පින්තූර සහ ඡායාරූප එකතු කරයි. | 03 | • 5,6,7, සහ 8 වන ඉගෙනුම් ඵල නිවස පාදක පැවරුම් මගින් ලඟා කරගැනීමට කටයුතු සලසන්න.<br>• ආකෘති,කෙටි වීඩියෝ පට, රූප සටහන් සහ ගුරු ආදර්ශන යොදා ගනිමින් සාකච්ඡා මෙහෙයවා ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |
| 4.4 ස්වාභාවික සම්පතක් ලෙස ඛනිජ හා පාෂාණවල ඇති වැදගත්කම පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | • ඛනිජ හා පාෂාණ<br>• ලාක්ෂණික<br>• ඛනිජ හා පාෂාණ වර්ග<br>• පාෂාණ ජීරණය<br>• පාෂාණ චක්‍රය | 1. ඛනිජ හා පාෂාණවල ලාක්ෂණික ප්‍රකාශ කරයි.<br>2. ඛනිජ හා පාෂාණ වෙන් කර දක්වයි.<br>3. පාෂාණ ජීරණයේ යාන්ත්‍රණය පැහැදිලි කරයි.<br>4. පාෂාණ චක්‍රය පැහැදිලි කරයි..<br>5. පින්තූර හා ඡායාරූප යොදා ගනිමින් පාෂාණ චක්‍රය නිරූපණය කරයි.<br>6. ස්වාභාවික සම්පත් ලෙස ඛනිජ හා පාෂාණ වල ඇති වැදගත්කම අවධාරණය කරයි. | 03 | • 5 වන ඉගෙනුම් ඵල නිවස පාදක පැවරුම් මගින් ලඟා කරගැනීමට කටයුතු සලසන්න.<br>• ආකෘති,කෙටි වීඩියෝ පට, රූප සටහන් සහ ගුරු ආදර්ශන යොදා ගනිමින් සාකච්ඡා මෙහෙයවා |

| | | | | |
|---|---|---|---|---|
| | | 7. ඛනිජ හා පාෂාණ සීමිත සම්පත් බවත් ඒවා තිරසර ලෙස භාවිත කළ යුතු බවත් පිළිගනියි. | | ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |
| 4.5 ශක්ති ප්‍රභව තිරසර ලෙස භාවිත කිරීම සඳහා කටයුතු කරයි. | • ශක්ති ප්‍රභව<br>• ප්‍රතිජනනීය<br>• ප්‍රතිජනනීය නොවන | 1. පුනර්ජනනීය ශක්ති ප්‍රභව හා පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව යන පද විස්තර කරයි.<br>2. පුනර්ජනනීය ශක්ති ප්‍රභව හා පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව සඳහා උදාහරණ සපයයි.<br>3. ශක්ති ප්‍රභවවල තිරසර භාවිතය අගය කරයි. | 02 | • කෙටි වීඩියෝ පට හා රූප සටහන් යොදා ගනිමින් සාකච්ඡා මෙහෙයවා ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |
| **සමස්ථ කාලච්ඡේද ගණන 28** | | | | |

# 8 ශ්‍රේණියෙන් තෝරා ගන්නා ලද ආවරණය කිරීමට නියමිත විෂය අන්තර්ගතය සහ ඉගෙනුම් ඵල

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද | විශේෂ සටහන් |
|---|---|---|---|---|---|
| **1.0 ජෛවීය පද්ධතිවල ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා ජීවය හා ජෛව ක්‍රියාවලි ගවේෂණය කරයි.** | 1.1 ක්ෂුද්‍ර ජීවීන්ගේ වැදගත්කම ගවේෂණය කරයි. | • ක්ෂුද්‍ර ජීවීන්ගේ වැදගත්කම<br>• ක්ෂුද්‍ර ජීවීන්ගේ බලපෑම | ශිෂ්‍යයන්ට:<br>1. පියවි ඇසින් දැකිය නොහැකි ජීවීන් සිටින බව පෙන්වීමට සරල ක්‍රියාකාරකම් සිදු කිරීමටත්<br>2. ක්ෂුද්‍ර ජීවීන් ආහාර මත ඇති කරන බලපෑම් විමර්ශනය කිරීමට කණ්ඩායම් ක්‍රියාකාරකම් නිර්මාණය කිරීමට හා සිදු කිරීමටත්<br>3. ක්ෂුද්‍ර ජීවීන් විසින් යම් යම් ද්‍රව්‍යවල ගුණ වෙනස් කිරීමට භාජන කරන අවස්ථා ගවේෂණය කිරීමටත්<br>4. ක්ෂුද්‍ර ජීවීන්ගේ වැදගත්කම පිළිබඳ තොරතුරු රැස් කිරීමට හා ඉදිරිපත් කිරීමටත්<br>5. ක්ෂුද්‍ර ජීවීන්ගේ වැදගත්කම ප්‍රකාශ කිරීමටත්<br>6. ඇතැම් ක්ෂුද්‍ර ජීවීන් ප්‍රයෝජනවත් බව සහ තවත් ඇතැම් ක්ෂුද්‍ර ජීවීන් හානිකර බව පිළිගැනීමටත් පිළිවන් විය යුතු ය. | 03 | • 1 හා 2 ඉගෙනුම් ඵල ගුරු ආදර්ශන ඇසුරෙන් ද 3 ඉගෙනුම් ඵලය රූප සටහන් හෝ වීඩියෝ යොදාගෙන කරුණු සාකච්ඡා කිරීමෙන් ද 4 ඉගෙනුම් ඵලය නිවස පාදක පැවරුමක් ඇසුරින් ද සාධනය කිරීමට කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.2 සත්ත්ව කාණ්ඩවල බාහිර ලක්ෂණ පරීක්ෂා කරයි. | • සත්ත්ව වර්ගීකරණය<br>• ප්‍රධාන අපෘෂ්ඨවංශී කාණ්ඩ<br>• ප්‍රධාන පෘෂ්ඨවංශී කාණ්ඩ | ශිෂ්‍යයන්ට :<br>1. අපෘෂ්ඨවංශී කාණ්ඩ සඳහා නිදසුන් කිහිපයක් සඳහන් කරමින් හැකි ආදර්ශ කිහිපයක් එකතු කිරීමටත් (සීලෙන්ටරේටාවන්, ඇනෙලිඩාවන්, මොලුස්කාවන් හා ආත්‍රොපෝඩාවන්)<br>2. පෘෂ්ඨවංශී කාණ්ඩ සඳහා නිදසුන් කිහිපයක් සඳහන් කරමින් හැකි ආදර්ශ කිහිපයක් එකතු කිරීමටත් (පිස්කේස්/මත්ස්‍යයන්, ඇම්පිබියාවන්, ක්ෂීරපායීන්)<br>3. බාහිර ලක්ෂණ උපයෝගී කර ගනිමින් දෙන ලද අපෘෂ්ඨවංශීන් ප්‍රධාන කාණ්ඩවලට වර්ගීකරණය කිරීමටත්<br>4. බාහිර ලක්ෂණ උපයෝගි කර ගනිමින් දෙන ලද පෘෂ්ඨවංශීන් ප්‍රධාන කාණ්ඩවලට වර්ගීකරණය කිරීමටත්<br>5. අපෘෂ්ඨවංශීන්ගේ හා පෘෂ්ඨවංශීන්ගේ විවිධත්වය අගය කිරීමටත්<br>පිළිවන් විය යුතු ය. | 03 | • සජීවී නිදර්ශක, රූප සටහන් හා වීඩියෝ දර්ශන යොදාගනිමින් සාකච්ඡාවක් මෙහෙයවීම මගින් ඉගෙනුම් ඵල සාධනය කිරීමට කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.3 ශාකවල ප්‍රධාන කෘත්‍ය විස්තර කරයි. | • ශාකයක කොටස්වල ප්‍රධාන කෘත්‍ය<br>• ශාක පත්‍රවල ප්‍රධාන කෘත්‍ය<br>• ශාක පත්‍රවල අනෙකුත් කෘත්‍ය<br>• ශාක පත්‍රවල විවිධත්වය<br>• ශාක කඳෙහි ප්‍රධාන කෘත්‍ය<br>• ශාක කඳෙහි අනෙකුත් කෘත්‍ය<br>• ශාක කඳන්වල විවිධත්වය<br>• ශාක මුල්වල ප්‍රධාන කෘත්‍ය<br>• ශාක මුල්වල අනෙකුත් කෘත්‍ය<br>• ශාක මුල්වල විවිධත්වය | ශිෂ්‍යන්ට:<br>1. ශාකයක ප්‍රධාන කොටස් ගවේෂණය කර ඒවායේ රූප සටහන් ඇඳීමටත්<br>2. ශාකයක ප්‍රධාන කොටස්වල මූලික කෘත්‍ය විස්තර කිරීමටත්<br>3. ශාකවල විවිධත්වයට තුඩු දෙන අනුවර්තන පැහැදිලි කිරීමටත්<br>4. ශාකවල ප්‍රධාන කොටස්වල අනුවර්තන ඒවායේ සුවිශේෂ කෘත්‍යවලට සම්බන්ධ කිරීම අරමුණු කර ගනිමින් පරිසරය විමර්ශනය කිරීමටත්<br>5. සුවිශේෂ අනුවර්තන සහිත ශාක පත්‍රවල,කඳන්වල හා මුල්වල ආදර්ශ එකතු කිරීමට හා ඇඳීමටත්<br>6. ශාක ආදර්ශවල එකතුවක් පිළියෙල කිරීමට හා අදාළ තොරතුරු සමග ඒවා සංරක්ෂණය කිරීමටත්<br>7. ශාකවල විවිධ කොටස්වල විවිධත්වය අගය කිරීමටත්<br>8. පරිසර ගවේෂණයේ දී පරිසරයට සිදු විය හැකි හානිය අවම විය යුතු බව පිළිගැනීමටත් පිළිවන් විය යුතු ය. | 03 | • පාඩම ඇරඹීමට පෙර නිවස පාදක පැවරුමක් ලෙස ශාක පත්‍ර වල,කඳන් වල,හා මුල් වල විවිධත්වය ගවේශනය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.4 මානව බහිස්ස්‍රාවීය පද්ධතිය ගවේෂණය කරයි. | • මානව බහිස්ස්‍රාවීය ඉන්ද්‍රීය හා බහිස්ස්‍රාවීය ඵල<br>• වෘක්ක - මුත්‍ර<br>• පෙනහලු - කාබන්ඩයොක්සයිඩ්<br>• සම - ස්වේදය<br>• මුත්‍ර පද්ධතියෙහි කොටස්<br>• වෘක්ක<br>• ව්‍යූහය<br>• පිහිටීම | ශිෂ්‍යයන්ට :<br>• බහිස්ස්‍රාවය යනු කුමක් දැයි ප්‍රකාශ කිරීමටත්<br>• මානව බහිස්ස්‍රාවීය ඉන්ද්‍රීය හා බහිස්ස්‍රාවීය ඵල නම් කිරීමටත්<br>• මානව මුත්‍ර පද්ධතියෙහි ප්‍රධාන කොටස් ඇඳ නම් කිරීමටත්<br>• වෘක්කයේ පිහිටීම හා ව්‍යූහය විස්තර කිරීමටත්<br>• වකුගඩුවලට හානි වීමට හේතු හා එය වළක්වා ගැනීමට අනුගමනය කළ යුතු පිළිවෙත් ප්‍රකාශ කිරීමටත්<br>• නිසි පරිදි ක්‍රියාත්මක වන බහිස්ස්‍රාවීය පද්ධතියක් සඳහා සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් පවත්වා ගැනීමේ වැදගත්කම පිළිගැනීමටත්<br>පිළිවන් විය යුතු ය. | 02 | • ආකෘති , රූප සටහන් හා ගුරු ගෙදර පාඩම් ඇසුරින් සාකච්ඡා මෙහෙයවමින් ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.5 මානව ස්නායු පද්ධති ගවේෂණය කරයි. | • මානව ස්නායු පද්ධතිය<br>• ස්නායු සමායෝජනය<br>• මධ්‍ය ස්නායු පද්ධතියේ ප්‍රධාන කොටස්<br>• පර්යන්ත ස්නායු පද්ධතිය | ශිෂ්‍යයන්ට:<br>1. ස්නායු සමායෝජනය යනු කවරක් දැයි සාකච්ඡා කිරීමටත්<br>2. මානව මධ්‍ය ස්නායු පද්ධතියේ ප්‍රධාන කොටස් හඳුනා ගැනීමටත්<br>3. මධ්‍ය ස්නායු පද්ධතිය ආරක්ෂා වී ඇති ආකාරය ප්‍රකාශ කිරීමටත්<br>4. පර්යන්ත ස්නායු පද්ධතිය යනු කුමක් දැයි ප්‍රකාශ කිරීමටත්<br>5. එදිනෙදා කටයුතුවල දී පහසුවෙන් හානියට පත් විය හැකි ස්නායු පද්ධතියේ ආරක්ෂාව සඳහා අවශ්‍ය පිළිවෙත් අනුගමනය කිරීමේ වැදගත්කම පිළිගැනීමටත්<br>පිළිවන් විය යුතු ය. | 02 | • ආකෘති , රූප සටහන් හා ගුරු ගෙදර පාඩම් ඇසුරින් සාකච්ඡා මෙහෙයවමින් ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.6 මිනිසාගේ සමෙහි ව්‍යුහමය හා කෘත්‍යමය සම්බන්ධතාව පරීක්ෂා කරයි. | • මානව සමෙහි මූලික ව්‍යුහය<br>• සමෙහි මූලික කෘත්‍ය | ශිෂ්‍යයන්ට:<br>1. මානව සමේ ප්‍රධාන කෘත්‍ය පැහැදිලි කිරීමටත්<br>2. මානව සමෙහි දළ සටහනක් ඇඳීමට හා එහි ප්‍රධාන කොටස් නම් කිරීමටත්<br>3. සම මත කෙරෙන සමහර පිරියම් හා ඒවායේ ප්‍රතිඵල පිළිබඳ ව තොරතුරු රැස් කිරීමටත්<br>4. නීරෝගී සමක් පවත්වා ගැනීමේ වැදගත්කම පිළිගැනීමටත්<br>5. සම අනවශ්‍ය පිරියම් කිරීම්වලට භාජන කිරීමෙන් වැළකීමේ අවශ්‍යතාව පිළිගැනීමටත් පිළිවන් විය යුතු ය. | 02 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.7 ශාකවල පැවැත්ම හා පරිසරයේ සුරක්ෂිතතාව තහවුරු කෙරෙන ශාක ක්‍රියාවලි සමහරක් විමර්ශනය කරයි. | • ශාක තුළ ද්‍රව්‍ය පරිවහනය සඳහා උපයෝගී වන යන්ත්‍රණ<br>  • ආස්‍රැතිය<br>  • විසරණය<br>• ශාක තුළ සිදු වන ක්‍රියාවලි<br>  • පරිවහනය<br>    • ජලය පරිවහනය<br>    • ඛනිජ පරිවහනය<br>    • ආහාර පරිවහනය<br>  • උත්ස්වේදනය<br>  • ක්‍රියාවලිය<br>• ශාකවල උත්ස්වේදනය අඩු කිරීමේ අනුවර්තන<br>  • උත්ස්වේදනයේ වැදගත්කම<br>  • බින්දුදය<br>  • ප්‍රභාසංස්ලේෂණය<br>    • අමුද්‍රව්‍ය<br>    • ඵල<br>    • වැදගත්කම | ශිෂ්‍යයන්ට:<br>1. විසරණය හා ආස්‍රැතිය ආදර්ශනය කිරීමට සරල ක්‍රියාකාරකම් සිදු කිරීමටත්<br>2. විසරණය හා ආස්‍රැතිය ශාකවල ප්‍රධාන පරිවහන ක්‍රම ලෙස විස්තර කිරීමටත්<br>3. ජලය පරිවහනය පෙන්නුම් කිරීම සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කිරීමටත්<br>4. ද්‍රාව්‍ය ඛනිජ හා ආහාර ද්‍රව්‍ය ශාකවල පරිවහන පද්ධති හරහා පරිවහනය වීම සඳහා සුදුසු උදාහරණ ප්‍රකාශ කිරීමටත්<br>5. ශාකවල පැවැත්ම සඳහා ද්‍රව්‍ය පරිවහනයේ වැදගත්කම පිළිගැනීමටත්<br>6. ශාකවල උත්ස්වේදනය පෙන්වීම සඳහා සරල ක්‍රියාකාරකම් නිර්මාණය කිරීමට හා සිදු කිරීමටත්<br>7. සුදුසු උදාහරණ මගින් උත්ස්වේදනය අවම කිරීම සඳහා ශාකවල ඇති අනුවර්තන විමර්ශනය කිරීමට හා වාර්තා කිරීමටත්<br>8. උත්ස්වේදනයේ වැදගත්කම පිළිගැනීමටත් | 05 | • 1,3 හා 6 ඉගෙනුම් ඵල ලගා කර ගැනීමට සඳහා ගුරු ආදර්ශන සිදු කිරීම ඔස්සේ කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 9. බින්දුදය හා  උත්ස්වේදනය අතර වෙනස හඳුනා ගැනීමටත්<br>10. ප්‍රභාසංශ්ලේෂණයේ ප්‍රධාන ඵලය හා අතුරු ඵලය පෙන්වීම සඳහා සරල පරීක්ෂා සිදු කිරීමටත්<br>11. ප්‍රභාසංශ්ලේෂණය වචන සමීකරණයක් මගින් දැක්වීමටත්<br>12. ප්‍රභාසංශ්ලේෂණයේ ගෝලීය වැදගත්කම පිළිබඳ වාර්තාවක් සංග්‍රහ කිරීමටත්<br>13. ජෛව ලෝකයේ පැවැත්ම සඳහා ප්‍රභාසංශ්ලේෂණයේ වැදගත්කම පිළිගැනීමටත්<br>පිළිවන් විය යුතු ය | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.8 ජීවියකුගේ ජීවන චක්‍රය නිරීක්ෂණය කර අවබෝධ කර ගනියි. | • ජීවියකුගේ ජීවන චක්‍රය<br>  • ශාක<br>  • සත්ව<br>• විවිධාකාර ජීවන චක්‍ර<br>  • රූපාන්තරණය සහිත ජීවන චක්‍ර<br>  • රූපාන්තරණය රහිත ජීවන චක්‍ර<br>• ජීවන චක්‍රවල ආර්ථික වටිනාකම | ශිෂ්‍යයන්ට:<br>1. සෑම ජීවියකුට ම ජීවන චක්‍රයකින් සම්පූර්ණ වන ජීවිත කාලයක් ඇති බව රූපසටහන් ඇසුරින් පෙන්වා දීමටත්<br>2. මානවයාගේ හා සමනලයාගේ ජීවන චක්‍ර හඳුන්වා දී සංසන්දනය කිරීමටත්<br>3. රූපාන්තරණය යන පදය විස්තර කිරීමටත<br>4. රූපාන්තරණය සහිත ජීවන චක්‍ර ඇති ජීවීන් (මැඩියා) හා රූපාන්තරණය  රහිත ජීවන චක්‍ර ඇති ජීවීන් (කැරපොත්තා ) සඳහා නිදසුන් සැපයීමටත්<br>5. සම්පූර්ණ හා අසම්පූර්ණ රූපාන්තරණ වෙන් කර හඳුනා ගැනීමටත්<br>6. සම්පූර්ණ හා අසම්පූර්ණ රූපාන්තරණ සඳහා නිදසුන් සැපයීමටත්<br>7. රූපසටහන් ඇසුරින් සපුෂ්ප ශාකයක ජීවන චක්‍රය ඉදිරිපත් කිරීමටත්<br>8. සාර්ථක ලෙස මර්ධනය කිරීමේ අරමුණින් යුතු ව පළිබෝධකයන්ගේ ජීවන චක්‍රවල විවිධ අදියර හඳුනා ගැනීමටත්<br>9. පළිබෝධ සාර්ථක ලෙස මර්දනය කිරීම සඳහා ජීවන චක්‍රවල අදියර භාවිතයට ගත හැකි බව පිළිගැනීමටත්<br>10. ජෛව විවිධත්වය සුරැකීම සඳහා ජීවන චක්‍රවල සංවේදී අදියර ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිගැනීමට | 04 | • රූප සටහන්,ගුරුගෙදර පාඩම් හා කෙටි වීඩියෝ පට ඇසුරින් සාකච්ඡා මෙහෙයවමින් ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.9 ආහාර ද්‍රව්‍යයක් මිල දී ගැනීමේ දී ආහාර පරිරක්ෂණය හා පැසුරුම පිළිබඳ දැනුම භාවිතයට ගනී. | • පරිරක්ෂිත ආහාර<br>• පිරිසැලසුම් කර ලද ආහාර | ශිෂ්‍යයන්ට:<br>1. ආහාර පරිරක්ෂණය යනු කුමක්ද යි විස්තර කිරීමටත්<br>2. ආහාර පරිරක්ෂණයේ අවශ්‍යතාව පැහැදිලි කිරීමටත්<br>3. පරිරක්ෂණය කරන ලද හා පරිරක්ෂණය නොකරන ලද ආහාර සඳහා නිදසුන් සැපයීමටත්<br>4. ඇසුරුම් කරන ලද ආහාර සඳහා නිදසුන් සැපයීමටත්<br>5. ආහාර පරිරක්ෂණය සඳහා භාවිත කෙරෙන විවිධ සාම්ප්‍රදායික හා නවීන තාක්ෂණික ක්‍රම ලයිස්තුගත කිරීමටත්<br>6. ආහාර පරිරක්ෂණයට පදනම්වන මූලධර්ම පැහැදිලි කිරීමටත්<br>7. සපයන ලද ආහාරමය අයිතම පරිරක්ෂණය කිරීමටත්<br>8. පරිරක්ෂණය කරන ලද හා පිරිසැලසුම් කරන ලද ආහාරවල වාසි හා අවාසි ලයිස්තුගත කිරීමටත්<br>9. මිලදී ගැනීමට පෙර පිරිසැලසුම් කරන ලද ආහාර ඇසුරුම්වල මුද්‍රණය කර ඇති තොරතුරු විශ්ලේෂණය කිරීමේ වැදගත්කම පිළිගැනීමටත්<br>පිළිවන් විය යුතු ය. | 03 | • ආහාර පරිරක්ෂණය කිරීමට අදාල පන්ති කාමරයේදී සිදු කිරීමට නියමිත ක්‍රියාකාරකම් පැවරුමක් ලෙස නිවසේදී දිදු කිරීමට කටයුතු සලස්වන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **2.0 ජීවිතයේ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා පදාර්ථයලපදාර්ථයේ ගුණ හා ඒවායේ අන්තර්ක්‍රියා විමර්ශනය කරයිග** | 2.1 පදාර්ථයේ අසන්තත ස්වභාවය විමර්ශනය කරයි. | • පදාර්ථයේ අංශුමය/අසන්තත ස්වභාවය<br>• අංශුමය ස්වභාවයට සාපේක්ෂ ව පදාර්ථයේ භෞතික ගුණ (ගුණාත්මක ව)<br>  • හැඩය<br>  • පරිමාව<br>  • සම්පීඩ්‍යතාව<br>  • ඝනත්වය<br>• පදාර්ථයෙහි ත්‍රිවිධ අවස්ථාවෙහිල අංශුවල සැකැස්මෙහි හා චලනයේ වෙනස්කම් | ශිෂ්‍යයන්ට:<br>1. ඝන, ද්‍රව හා වායුවල අංශුමය/අසන්තත බව පෙන්නුම් කිරීම සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කිරීමටත්<br>2. පදාර්ථයේ අසන්තත බව තහවුරු කෙරෙන නිදසුන් ලයිස්තුගත කිරීමටත්<br>3. පදාර්ථයේ ත්‍රිවිධ අවස්ථාවෙහි අංශුවල සැකැස්ම රූපසටහන් ඇසුරින් නිරූපණය කිරීමටත්<br>4. පදාර්ථය ඉතා කුඩා අංශුවලින් සෑදී ඇති බව ප්‍රකාශ කිරීමටත්<br>5. ඝන, ද්‍රව හා වායුවල භෞතික ගුණ හැඩය හා පරිමාව ලෙස පැහැදිලි කිරීමටත්<br>6. ඝනත්වය හා සම්පීඩ්‍යතාව පැහැදිලි කිරීමට හා ඒවා පදාර්ථයේ තවත් භෞතික ගුණ දෙකක් සේ හඳුන්වාදීමටත්<br>7. දෙන ලද භෞතික ගුණයකට ඇසුරෙන් ඝන, ද්‍රව හා වායු සංසන්දනය කිරීමටත් | 04 | • 1,5 හා 6 ඉගෙනුම් ඵල ලඟා කර ගැනීමට සඳහා ගුරු ආදර්ශන සිදු කිරීම ඔස්සේ කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 8. දෛනික ජීවිතයට පදාර්ථයේ අසන්තත ස්වභාවයෙහි වැදගත්කම පිළිගැනීමටත්<br>9. පදාර්ථයේ ස්වභාවය අවබෝධ කිරීම සඳහා විද්‍යාඥයින් විසින් භාවිත කෙරෙන තාර්කික සමපේක්ෂණය(අනුමාන කල්පනාව) අගය කිරීමටත් පිළිවන් විය යුතු ය. | | |
| | 2.2 දෛනික ජීවිතයේ දී පදාර්ථයේ භෞතික ගුණ ප්‍රයෝජනයට ගන්නා ආකාරය විමර්ශනය කරයි. | • පදාර්ථයේ භෞතික ගුණ<br>• ප්‍රභාව/දිස්නය<br>• වර්ණය<br>• වයනය<br>• දෘඪතාව<br>• ප්‍රත්‍යස්ථතාව<br>• ගන්ධය<br>• භංගුර බව<br>• ඝනත්වය<br>• ප්‍රසාරණතාව<br>• සන්නායකතාව (තාප හා විද්‍යුත්)<br>• තන්‍යතාව<br>• ආඝාතවර්ධ්‍යතාව | ශිෂ්‍යයන්ට:<br>1. දී ඇති ද්‍රව්‍ය සංශුද්ධ හා සංශුද්ධ නොවන ද්‍රව්‍ය ලෙස වර්ග කිරීමටත්<br>2. නියත සංයුතියක් ඇති ද්‍රව්‍ය සංශුද්ධ ද්‍රව්‍ය ලෙස හැඳින්වීමටත්<br>3. තවදුරටත් වෙන් කළ නොහැකි සංශුද්ධ ද්‍රව්‍ය මූලද්‍රව්‍ය ලෙස හැඳින්වීමටත්<br>4. මූලද්‍රව්‍ය දෙකක් හෝ ඊට වැඩි ගණනක් අන්තර්ගත සංශුද්ධ ද්‍රව්‍ය සංයෝග ලෙස හැඳින්වීමටත්<br>5. භෞතික ගුණ ගවේෂණය සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කිරීමටත්<br>6. විවිධ ද්‍රව්‍ය විවිධ භෞතික ගුණවලින් යුතු බව විස්තර කිරීමටත්<br>7. ඝනත්වය, ද්‍රවාංකය හා තාපාංකය නිරීක්ෂණය කිරීම සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කිරීමටත් | 04 | • ගුරු ආදර්ශනයක් ඔස්සේ 1,2,3,4,7,8 හා 9 ඉගෙනුම් ඵල සාධනට කටයුතු කරන්න.<br>• භෞතික ගුණ ගවේශනය කිරීමේදීවයනය, දෘඪතාව, ප්‍රත්‍යස්ථතාව, ගන්ධය, භංගුර බව,ඝනත්වය, තන්‍යතාව, ආඝාතවර්ධ්‍යතාව, රැව් දෙන හඬ පිළිබඳ ක්‍රියාකාරකම් සිදු අත්‍යවශය නොවේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • රැව් දෙන හඬ<br>• සංශුද්ධ ද්‍රව්‍ය<br>• මූල ද්‍රව්‍ය<br>• ලෝහ සහ අලෝහ<br>• සංයෝග | 8. දෙන ලද ද්‍රව්‍යවල විද්‍යුත් සන්නායකතාව පෙන්නුම් කිරීම සඳහා සරල ක්‍රියාකාරකමක් නිර්මාණය කිරීමටත්<br>9. සංශුද්ධ ද්‍රව්‍යවල ඝනත්වය, ද්‍රවාංකය හා තාපාංකය වැනි භෞතික ගුණ සඳහා නියත අගය පවතින බව ප්‍රකාශ කිරීමටත්<br>10. දෙන ලද සංශුද්ධ ද්‍රව්‍ය මූල ද්‍රව්‍ය හා සංයෝග ලෙස වර්ග කිරීමටත්<br>11. භෞතික ගුණ පදනම් කර ගනිමින් දෙන ලද මූලද්‍රව්‍ය ලෝහ හා අලෝහ ලෙස වර්ග කිරීමටත්<br>12. දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම් සඳහා ද්‍රව්‍යවල භෞතික ගුණ ප්‍රයෝජනවත් වන බව පිළිගැනීමටත්<br>පිළිවන් විය යුතු ය. | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2.3 පරිසරයේ සිදු වන පදාර්ථයේ වෙනස්කම්වල ප්‍රතිඵල ගවේෂණය කරයි. | • පදාර්ථයේ විපර්යාස<br>• අවස්ථා විපර්යාස අනුබද්ධ භෞතික විපර්යාස<br>  • ද්‍රව වීම/ වියලනය<br>  • වාෂ්පීකරණය<br>  • ඌර්ධ්වපාතනය<br>  • ඝනීභවනය<br>  • හිමායනය<br>• රසායනික විපර්යාස<br>  • රසායනික විපර්යාස සඳහා සාක්ෂි<br>    • වර්ණය වෙනස් වීම<br>    • වායු පිටවීම<br>    • තාපය පිට කිරීම හෝ අවශෝෂනය කිරීම<br>    • අවක්ෂේප සෑදීම<br>  • ප්‍රතික්‍රියා හා ඵල<br>  • විවෘත හා සංවෘත පද්ධති<br>  • ස්කන්ධ සංස්ථිති නියමය<br>• රසායනික විපර්යාස සඳහා සුලබ නිදසුන්<br>  • දහනය<br>  • ලෝහ මලින වීම<br>    • විබාදනය | ශිෂ්‍යයන්ට:<br>1. පදාර්ථයේ වෙනස්කම් ආදර්ශනය කිරීමට සරල ක්‍රියාකාරකම් සිදු කිරීමටත්<br>2. ශක්තිය සැපයීමෙන් පදාර්ථයේ වෙනස්කම් සිදු කළ හැකි බව ප්‍රකාශ කිරීමටත්<br>3. ද්‍රව්‍යවල සංයුතිය වෙනසකට භාජනය වීම හෝ නොවීම අනුව දෙන ලද විපර්යාස වර්ග කිරීමටත්<br>4. භෞතික විපර්යාසයක් යනු ද්‍රව්‍යයක සංයුතිය වෙනසකට භාජනය නොවන වෙනසක් බව ප්‍රකාශ කිරීමටත්<br>5. රසායනික විපර්යාසයක දී හැම විට ම වෙනස් සංයුතියකින් යුත් නව ද්‍රව්‍ය සෑදීමක් සිදු වන බවත්<br>6. අවස්ථා විපර්යාස අනුබද්ධ භෞතික විපර්යාස ආදර්ශනය සඳහා සරල ක්‍රියාකාරකම් නිර්මාණය කිරීමට හා සිදු කිරීමටත්<br>7. සරල ක්‍රියාකාරකම් මගින් රසායනික විපර්යාස සිදු වූ බවට සාක්ෂි ඉදිරිපත් කිරීමටත්<br>8. දෙන ලද රසායනික විපර්යාසයක ප්‍රතික්‍රියක හා ඵල හඳුනා ගැනීමටත්<br>9. සරල ක්‍රියාකාරකම් ඇසුරින් විවෘත පද්ධතියක් හා සංවෘත පද්ධතියක් යනු කුමක්ද යි විස්තර කිරීමටත් | 11 | • ගුරු ආදර්ශන හා සාකච්ඡා ඔස්සෙ ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | • යකඩ මල බැඳීම<br>• යකඩ මල බැඳීම වැළැක්වීම<br>• උදාසීනකරණය | 10. සිදු කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල භාවිතයෙන් ස්කන්ධ සංස්ථිති නියමය ප්‍රකාශ කිරීමටත්<br>11. දහනය යනු දාහ්‍ය ද්‍රව්‍යයක් හා දහන පෝෂකයක් අතර ප්‍රතික්‍රියාවක් ලෙස විස්තර කිරීමටත්<br>12. ගිනි ත්‍රිකෝණය හා ගින්නක් ඇති වීමට ජ්වලන උෂ්ණත්වය කරා එළඹීමේ අවශ්‍යතාව විස්තර කිරීමටත්<br>13. දහනයේ දී කාබන්ඩයොක්සයිඩ් හා ජලය නිපදෙන බව ආදර්ශනය කිරීම සඳහා පරීක්ෂණ නිර්මාණය කිරීමට හා සිදු කිරීමටත්<br>14. සම්පූර්ණ දහනය හා අසම්පූර්ණ දහනය අතර වෙනස හඳුනා ගැනීමටත්<br>15. ඉටිපන්දම් හා බන්සන් දාහක දැල්ලෙහි කලාප නම් කිරීමටත්<br>16. ලෝහ මලින වීම හා යකඩ මල බැඳීම රසායනික විපර්යාස බව ප්‍රකාශ කිරීමටත්<br>17. යකඩ මල බැඳීමට බලපාන සාධකවල අවශ්‍යතාව ආදර්ශනය කිරීම සඳහා සරල පරීක්ෂණ සිදු කිරීමටත් | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 18. යකඩ මල බැඳීම වැළැක්වීම සඳහා භාවිත කළ හැකි ක්‍රම හඳුන්වා දීමටත්<br>19. එදිනෙදා ජීවිතයේ භාවිත කෙරෙන යකඩ භාණ්ඩවල මල බැඳීම මන්දනය කිරීම සඳහා අවශ්‍ය පූර්වෝපාය යොදා ගැනීමටත්<br>20. ආර්ථික වශයෙන් අතිමහත් අලාභයකට හේතු වන යකඩවල මල බැඳීම වැළැක්වීමේ වැදගත්කම පිළිගැනීමටත්<br>21. අම්ල,හස්මවලින් ද. හස්ම, අම්ලවලින් ද උදාසීන වන බව ප්‍රකාශ කිරීමටත්<br>22. සුදුසු දර්ශකයක් භාවිතයෙන් උදාසීනකරණ ප්‍රතික්‍රියා ආදර්ශනය කිරීමටත්<br>23. එදිනෙදා ජීවිතයේ දී උදාසීනකරණ මූලධර්ම යොදා ගැනීම සඳහා නිදසුන් සැපයීමටත්<br>24. එදිනෙදා ජීවිතයේ සිදු වන විපර්යාස, භෞතික විපර්යාස හා රසායනික විපර්යාස ලෙස වර්ගීකරණය කිරීමටත්<br>පිළිවන් විය යුතුය. | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **3.0 කාර්යක්ෂමතාව හා ඵලදායකත්වය ප්‍රහස්ත මට්ටමක පවත්වා ගනිමින් ශක්තියේ විවිධ ස්වරූපලෑවා පදාර්ථය හා සිදු කරන අන්තර්ක්‍රියා සහ ශක්ති පරිණාමන භාවිතයට ගනියි** | 3.1 ධ්වනිය නිෂ්පාදනය පිළිබඳ ව දැනුවත් වෙයි.<br><br>3.2 ධ්වනිය නිෂ්පාදනය සඳහා සරල උපකරණ තනමින් අවශ්‍ය හඬ උත්පාදනය කිරීමට වුවමනා වෙනස්කම් සිදු කරයි. | • ධ්වනිය නිෂ්පාදනය<br>  • තන්තු හා දඬු<br>  • පටල<br>  • වා කඳන්<br><br>• කම්පනයෙන් ධ්වනිය නිෂ්පාදනය | ශිෂ්‍යයන්ට:<br>1. ධ්වනිය නිපදවන සරල භාණ්ඩ වාදනයෙන් තෙවැදෑරුම් ධ්වනි ප්‍රභව හඳුනා ගැනීමටත්<br>2. තන්තු හෝ දඬු, පටල හා වා කඳන් කම්පනයෙන් ධ්වනිය උපදවන සංගීත භාණ්ඩ සඳහා නිදසුන් සැපයීමටත්<br>3. සියලු ස්වභාවික හා කෘත්‍රිම ශබ්ද තන්තුවල හෝ දඬුවල, පටලවල හා වා කඳන්වල කම්පනයෙන් උත්පාදනය වන බව පැහැදිළි කිරීමටත්<br>4. සියලු කම්පන මානවයා විසින් ශ්‍රවණය කළ හැකි ධ්වනි නූපදවන බව පෙන්නුම් කිරීම සඳහා සරල ක්‍රියාකාරකමක් සිදු කිරීමටත්<br>5. සරසුල්වල බාහුවේ දිගෙහි වෙනස් වීම අනුව ඇති වන හඬෙහි විචලතාව හඳුනා ගැනීමටත් | 03 | • මුල් විශය නිර්දේශයේ අඩංගු 6හා 7 ඉගෙනුම් ඵල ඉවත් කරන ලදී.<br>• ගුරු ආදර්ශන හා සාකච්ඡා ඔස්සේ ඉගෙනුම් ඵල සාධනයට කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 6. සංගීත නාද හා ඝෝෂා අතර වෙනස පැහැදිලි කිරීමටත්<br>7. ජීවයේ ගුණාත්මය වැඩිදියුණු කිරීම සඳහා සංගීතයේ භාවිතය අගය කිරීමටත්<br>පිළිවන් විය යුතු ය. | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 3.3 ඵලදායි ලෙස චුම්බක භාවිත කිරීම පිළිබඳ අත්දැකීම් ලබයි. | • චුම්භක<br>• ස්ථිර චුම්බක<br>• චුම්බක ධ්‍රැව<br>• දණ්ඩ චුම්බකවල ක්ෂේත්‍ර රටා<br>• ස්ථිර චුම්බකවල භාවිත<br>• භූ චුම්බකත්වය හා මාලිමාව | ශිෂ්‍යයන්ට:<br>1. දණ්ඩ චුම්බකයක් වටා ඇති චුම්බක ක්ෂේත්‍රය විවිධ ක්‍රම මගින් ආදර්ශනය කිරීමටත්<br>2. චුම්බකයක් අවට චුම්බක බලය බලපවත්වන ප්‍රදේශය චුම්බක ක්ෂේත්‍රය ලෙස විස්තර කිරීමටත්<br>3. භූ චුම්බකත්වය යනු කුමක්දැයි පැහැදිලි කිරීමටත්<br>4. චුම්බක ක්ෂේත්‍රවල දිශාව සොයා ගැනීම සඳහා භාවිත කළ හැකි උපකරණය මාලිමාව ලෙස පහදා දීමටත්<br>5. චුම්බක උතුර හා භූගෝලීය උතුර අතර වෙනසක් පවතින බව ප්‍රකාශ කිරීමටත්<br>6. ස්පර්ශ ක්‍රමය හා විද්‍යුත් ක්‍රමය භාවිතයට ගනිමින් ස්ථිර චුම්බක තැනීමේ සරල ක්‍රියාකාරකම් සිදු කිරීමටත්<br>7. චුම්බක ගුණ දීර්ඝ කාලයක් රඳා පවතින ද්‍රව්‍යවලින් ස්ථිර චුම්බක තනන බව පැහැදිලි කිරීමටත් | 04 | • මුල් විශය නිර්දේශයේ අඩංගු 1,4හා 7 ඉගෙනුම් ඵල ඉවත් කරන ලදී.<br>• ඉගෙනුම් ඵල ලඟා කර ගැනීමට සඳහා ගුරු ආදර්ශන සිදු කිරීම ඔස්සේ කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 8. ස්ථිර චුම්බක තැනීම සඳහා වානේ ද තාවකාලික චුම්බක සඳහා මෘදු යකඩ ද යෝග්‍ය බව ප්‍රකාශ කිරීමටත්<br>9. නිසි පරිදි චුම්බක භාවිත කිරීමට හා අසුරා තැබීමටත්<br>10. ස්ථිර චුම්බකවල භාවිත සඳහා නිදසුන් දැක්වීමටත්<br>පිළිවන් විය යුතු ය. | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 3.4 ධාරා විද්‍යුතය සම්බන්ධ මූලික රාශි පිළිබඳ ව දැනුවත් වෙමින් අදාළ උපකරණ භාවිත කර එම රාශි මනියි | • ධාරා විද්‍යුතය ආශ්‍රිත රාශි හා එම රාශි මැනීම<br>• වෝල්ටීයතාව<br>• විද්‍යුත් ධාරාව<br>• ප්‍රතිරෝධය | ශිෂ්‍යයන්ට:<br>1. සුදුසු නිදසුන් ඇසුරින් විද්‍යුත් විභවය පැහැදිලි කිරීමටත්<br>2. වෝල්ටීයතාව විභව අන්තරයක් ලෙස පැහැදිලි කිරීමටත්<br>3. වෝල්ටීයතාවේ ඒකක වෝල්ට් (V) ලෙස ප්‍රකාශ කිරීමටත්<br>4. වෝල්ට්මීටරයක් භාවිත කර පරිපථයක දෙන ලද ලක්ෂ්‍ය දෙකක් අතර වෝල්ටීයතාව නිවැරදි ව මැනීමටත්,<br>5. විද්‍යුත් ධාරාවක් ඉහළ විභවයක සිට පහළ විභවයක් දක්වා ගලා යන බව විස්තර කිරීමටත්<br>6. විද්‍යුත් ධාරාවේ දිශාව ධනාග්‍රයේ සිට සෘණාග්‍රය වෙත යනුවෙන් ප්‍රකාශ කිරීමටත්<br>7. විද්‍යුත් ධාරාවේ ඒකකය ඇම්පියර් (A) ලෙස ප්‍රකාශ කිරීමටත්<br>8. ඇමීටරයක් භාවිත කර පරිපථයක දෙන ලද ලක්ෂ්‍යයක් පසුකර ගලන ධාරාව නිවැරදි ව මැනීමටත්<br>9. ප්‍රතිරෝධය යනු සන්නායකයක් හරහා ගලන ධාරාවට සන්නායකය විසින් ඇති කෙරෙන බාධාව බව පහදා දීමටත | 03 | • සිසුන දැනටමත් වෝල්ට මීටරය හා ඇමීටරය භාවිතයෙන් පාඨාංක ලබා ගැනීම සිදු කර තිබෙන බැවින් ගුරු ආදර්ශන හා සාකච්ඡා ඔස්සේ ඉගෙනුම් ඵල සාධනය සඳහා කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 10. ප්‍රතිරෝධයේ ඒකකය ඕමය (Ω) ලෙස පැහැදිලි කිරීමටත්<br>11. විද්‍යුතය ආශ්‍රිත රාශි නිවැරදි ව මැනීමේ වැදගත්කම පිළිගැනීමටත් පිළිවන් විය යුතු ය. | | |
| | 3.5 සරල විද්‍යුත් උවාරණවල ඵලදායිතාව දෛනික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගනියි. | • කෝෂ හා බල්බ සම්බන්ධ කිරීම<br>  • ශ්‍රේණිගත ව<br>  • සමාන්තරගත ව<br>• සරල විද්‍යුත් පරිපථ<br>  • විදුලි පන්දම<br>  • ආලෝක අලංකරණ<br>• නිවෙස් පරිසරයේ භාවිත වන විද්‍යුත් උවාරණවල ආරක්ෂාව හා ආර්ථික ප්‍රයෝජන<br>• ධාරා පාලන සංරචක<br>  • ස්විච්චි<br>  • ස්ථිර ප්‍රතිරෝධ<br>  • විචල්‍ය ප්‍රතිරෝධ<br>  • ධාරා නියාමකය<br>  • ආලෝක සංවේදී ප්‍රතිරෝධක (LDR) | ශිෂ්‍යයන්ට:<br>1. දෙන ලද පරිපථ සටහන් භාවිත කර සරල ශ්‍රේණිගත හා සමාන්තරගත පරිපථ ගොඩනැගීමටත්<br>2. ශ්‍රේණිගත හා සමාන්තරගත පරිපථ සම්බන්ධ නිරීක්ෂණ පැහැදිලි කිරීමටත්<br>3. විදුලි පන්දමක පරිපථ රූපසටහන ඇඳීමටත්<br>4. පරිපථය සම්පූර්ණ වූ විට පමණක් බල්බයක් දැල්වෙන බව ප්‍රකාශ කිරීමටත්<br>5. දෙන ලද අවස්ථාවලට ගැළපෙන පරිදි ආලෝක අලංකරණ පරිපථ තැනීමටත්<br>6. පරිපථ එකලස් කිරීමේ ආවුද ඵලදායි ලෙස භාවිත කිරීමටත්<br>7. පරිපථයක ධාරාව පාලනය කරන උපකරණ භාවිතයට ගැනීමටත්<br>8. නිවස තුළ විද්‍යුත් උවාරණ භාවිතයට ගැනීමේ දී අනුගමනය කළ යුතු | 05 | • 1,2.3 හා 4 ඉගෙනුම් ඵල ගුරු ආදර්ශනයක් ඔස්සේත් අවසාන ඉගෙනුම් ඵලය නිවස් පාදක පැවරුමක් ලෙසත් සාධනට කිරීමට කටයුතු කරන්න.<br>• 3.6 නිපුණතා මට්ටම සම්පූරණයෙන්ම ඉවත් කරන ලදී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ආරක්ෂිත පිළිවෙත් ලැයිස්තු ගත කිරීමටත්<br>9. නිවසේ භාවිතයට ගන්නා විද්‍යුත් උවාරණ පිළිබඳ තොරතුරු රැස් කිරීමට හා වඩා ඵලදායී හා කාර්යක්ෂම උවාරණ තෝරා ගැනීමටත්<br>පිළිවන් විය යුතු ය. | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **4.0 බුද්ධිමත් හා තිරසර ලෙස පරිභෝජනය කරනු පිණිස ස්වභාවික සංසිද්ධි අවබෝධ කර ගනිමින් පොළොවේ ස්වභාවයල ගුණ හා ක්‍රියාවලි ගවේෂණය කරයිග** | 4.1 සෞරග්‍රහ මණ්ඩලයල අභ්‍යවකාශය හා අභ්‍යවකාශ ගවේෂණ පිළිබඳ තොරතුරු පිරික්සයිග<br><br>4.2 සෞරග්‍රහ මණ්ඩලය හා ඒ ආශ්‍රිත වැදගත් සංසිද්ධි සමහරක් ආදර්ශනය කිරීමේ කුසලතා සංවර්ධනය කර ගනියිග | • සූර්යයා, පොළොව හා චන්ද්‍රයා<br>• පෘථිවියේ භ්‍රමණය හා පරිභ්‍රමණය<br>  • ඍතු<br>• චන්ද්‍ර කලා<br>  • ග්‍රහණ<br>    • චන්ද්‍ර ග්‍රහණය<br>    • සූර්ය ග්‍රහණය<br>• සෞරග්‍රහ මණ්ඩලය<br>• තරු රටා<br>  • රාශි චක්‍රයේ තරු රටා<br>  • වෙනත් තරු රටා<br>• අභ්‍යවකාශ ගවේෂණ<br>• කෘත්‍රිම චන්ද්‍රිකා | ශිෂ්‍යයන්ට:<br>1. පොළොවේ හා චන්ද්‍රයාගේ භ්‍රමණය හා පරිභ්‍රමණය ආදර්ශනය කිරීම සඳහා විවිධ ආකෘති තැනීමටත්<br>2. ඍතු විපර්යාස විස්තර කිරීම සඳහා ආකෘති භාවිත කිරීමටත්<br>3. රූප සටහන් මගින් චන්ද්‍ර කලා ඇති වීම පෙන්නුම් කිරීමටත්<br>4. චන්ද්‍ර ග්‍රහණ හා සූර්ය ග්‍රහණ ආදර්ශනය කිරීම සඳහා ආකෘති භාවිත කිරීමටත්<br>5. කිරණ සටහන් ආශ්‍රයෙන් සූර්ය ග්‍රහණ හා චන්ද්‍ර ග්‍රහණ ඇතිවීම විස්තර කිරීමටත්<br>6. සෞරග්‍රහ මණ්ඩලය විදහා දැක්වීමට විවිධ ආකෘති නිර්මාණය කිරීමටත්<br>7. ප්‍රධාන තරු රටා හඳුනා ගැනීමට හා ඇතැම් තරු රටාවලට අයත් වැදගත් තාරකා නම් කිරීමටත්<br>8. රාත්‍රී අහස නිරීක්ෂණය කිරීමෙන් ග්‍රහලෝක හා තාරකා හඳුනා ගැනීමටත් | 11 | • 1,4, හා 6 ඉගෙනුම් ඵලය නිවස් පාදක පැවරුම් ලෙස සාධනට කිරීමට කටයුතු සලසන්න.<br>• රූප සටහන් ආකෘති හා ගුරු ආදර්ශන භාවිත කරමින් සාකච්ඡා මෙහෙයවා සෙසු ඉගෙනුම් ඵල සාධනය සඳහා කටයුතු සලසන්න. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 9. පෘථිවියේ දෘශ්‍ය ගමන් මාර්ගයේ පිහිටි තෝරා ගන්නා ලද තරු පන්ති දොළොස රාශි චක්‍රය ලෙෂ හැඳින්වෙන බව ප්‍රකාශ කිරීමටත්<br>10. ආකර්ෂණීය ක්‍රම උපයෝගී කර ගනිමින් අභ්‍යවකාශ ගවේෂණය හා කෘත්‍රිම චන්ද්‍රිකා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමටත්<br>11. සන්නිවේදන පද්ධතිවල කෘත්‍රිම චන්ද්‍රිකාවල වැදගත්කම පිළිගැනීමටත්<br>12. සියලු අභ්‍යවකාශ ගවේෂණ ක්‍රියාකාරකම් මානවයාගේ යහපැවැත්ම අරමුණු කොට සිදුවිය යුතු බව පිළිගැනීමටත් පිළිවන් විය යුතු ය. | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 4.3 ස්වාභාවික ආපදා ආශ්‍රිත දේශගුණික විපර්යාසවල විද්‍යාත්මක පදනම ගවේෂණය කරයි. | • නියඟයෙහි<br>• ගංවතුරෙහි<br>• නායයෑම්වල<br>• අකුණුවල විද්‍යාත්මක පදනම | ශිෂ්‍යයන්ට<br>1. නියඟ, ගංවතුර, නායයෑම් හා අකුණු යන ස්වාභාවික ආපදාවලට හේතු විස්තර කිරීමටත්<br>2. ස්වාභාවික ආපදාවලින් සිදුවන හානි අවම කිරීම සඳහා ගන්නා පූර්වෝපායවල වැදගත්කම පිළිගැනීමටත්<br>3. ස්වාභාවික ආපදාවලින් සිදුවන හානි අවම කිරීමේ දී සන්නිවේදනයේ වැදගත්කම අගය කිරීමටත්<br>පිළිවන් විය යුතු ය. | 03 | • මුල් විශය නිර්දේශයේ අඩංගු දෙවන ඉගෙනුම් ඵල ඉවත් කරන ලදී<br>• රූප සටහන් කෙටි වීඩියෝ පට භාවිත කරමින් සකච්ඡා මෙහෙයවා ඉගෙනුම් ඵල සාධනය සඳහා කටයුතු සලසන්න. |

සමස්ථ කාලච්ඡේද සංඛ්‍යාව- 72